# තිරප්පන්කඩවල (හොරොව්පොතාන) ග්‍රාමයේ පුරාවිද්‍යාත්මක වැදගත්කම හා බෞද්ධ උරුමය

එච්. එම්. එම්. හේරත්[1], එම්. එම්. එස්. මහින්දපාල[2]

## හැඳින්වීම

මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයට විෂය වනුයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි තිරප්පන්කඩවල ග්‍රාමයයි. එය කල්පේ, කුංචුට්ටු, මහපොතාන, උඩ්ඩියන් කුලම, උලගල්ල, මාටොඹුව යන කෝරළයන් අතරින් කල්පේ කෝරළයට අයත් වේ.පුරාවිද්‍යාත්මක වැදගත්කමින් අනූන මෙම ග්‍රාමයේ බෞද්ධ උරුමය නොනැසී ආරාක්‍ෂා වී ඇතත් එම කරුණු පිළිබඳ මේ වන තෙක් විධිමත් පර්යේෂණාත්මක අධ්‍යයනයක් සිදු වී නොමැති අතර එහි ඌනපූර්ණත්වය මෙම අධ්‍යයනයෙන් සිදු කරනු ලැබේ.

## පර්යේෂණ ක්‍රමවේදය

තිරප්පන්කඩවල ග්‍රාමයේ ඓතිහාසිකත්වය හා බෞද්ධ උරුමය ගවේෂණය කිරීම ක්ෂේත්‍ර අධ්‍යයනය ඇසුරෙන් සිදු කර ඇත. එහිදි භික්ෂූන් වහන්සේලා, ග්‍රාමයේ වැඩිහිටියන් හා විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන පිරිස හමු වී කරුණු සාකච්ඡා කර දත්ත රැස් කළ අතර කල්පේ කෝරලය හා බැඳුණු සාහිත්‍ය මූලාශ්‍රය ද පදනම් කර ගනු ලැබීය.

## ප්‍රතිඵල

තිරප්පන්කඩවල ග්‍රාමයේ ඓතිහාසික උරුමය, පුරාවිද්‍යාත්මක වැදගත්කම, පුදපූජා චාරිත්‍ර, ඇදහිලි හා විශ්වාස පිළිබඳව ක්‍රමවත් අධ්‍යයනයක් සිදු වී නොමැති අතර මෙම අධ්‍යයනයෙන් සොයා ගත් දත්ත හා විමර්ශනයන් ඉදිරි පර්යේෂකයන්ට තිරප්පන්කඩවල ඓතිහාසිකත්වය හා පුරාවිද්‍යාත්මක උරුමය අධ්‍යයනයට මහත් පිටුවහලක් වනු ඇත.

## සාකච්ඡාව

තිර පහ පිදූ කඩවල 'තිරප්පන්කඩවල' නම් විය. ආදිවාසීන් ජීවත් වූ තිරප්පන්කඩවල ග්‍රාමයට ආසන්න පරදෙයියාකඩ ග්‍රාමයෙහි ද ආදිවාසීන් ජීවත් වූ ප්‍රදේශයකි. තිරප්පන්කඩවල වැවක් වූ අතර එය විනාශට පත්ව ඇත. එම ස්ථානය

[1] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය. පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, mahindaherat@gmail.com
[2] දෙවන වසර, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

'කඩවල' නමින් හැඳින්වේ. ආදිවාසීන් විසින් එම ස්ථානයේ තිර පහක් පූජා කර එම ස්ථානය පරදෙයියාකඩ ග්‍රාමයේ මිනිසුන්ට ලබා දී ඇත. තිර පහක් ආදිවාසීන් ඇදහූ අයියනායක, ඉලන්දාරී, බුදුරැස්, කඩවර හා කම්බිලි යන දේවතාවුන් වෙනුවෙන් පූජා කර ඇත. එයින් තිරපහ පිදූ කඩවල තිරප්පන්කඩවල නම් වී ඇත. වර්තමානයේ පරදෙයියාකඩ ග්‍රාමය ජනශූන්‍ය ප්‍රදේශයකි. එහි කුඹුරුවල හිමිකම ද තිරප්පන්කඩවල ගම්වැසියන්ට හිමිව ඇත. තිරප්පන්කඩවල ආදිවාසීන් සතුන් දඩයම් කිරීමට 'හබ' ඇටවූ ගම හබගම නමින් ව්‍යවහාර කෙරේ.

උඹ, වරෙන්, පලයන්, බං, බොලං යන වචන ලෙන්ගතු හැඟුමෙන් පවසන ජනවහරක් පවතින මෙම ග්‍රාමයෙහි සෙසු පොදු ජනබස්වහරක් ද භාවිත වේ. කෘෂිකර්මාන්තය ජීවන උපාය කරගත් ජනයා වී වගාවත් හේන් ගොවිතැනත් සිදු කරයි. සතුන් දඩයම් කිරීම, කුඹල් වැඩ, යකඩ වැඩ, නියං කාලවල ජලය සිඳුණු වැව්වල මසුන් මැරීම, මෙහෙකාර සේවය, රාජ්‍ය සේවය සිය ජීවනෝපාය වුවත් සියල්ලෝම ගොවිතැන් කිරීම පුරුද්දක් වශයෙන් සිදු කරති. වැව් ජලය යොදා ගෙන යල හා මහා කන්න දෙකෙහි මඩ ගොවිතැන ද වැසි ජලයෙන් සිදු කරන ගොඩ ගොවිතැන ද බහුලව සිදු කෙරේ. කුඹුරුවල හා වැව් ජලයේ භාරකාරත්වය විදානේට හිමිව ඇති අතර වැවේ ජල ප්‍රමාණයට අනුව වී ගොවිතැන් කිරීම නම් වූ 'බෙත්ම' ක්‍රමය මෙහි ක්‍රියාත්මක වේ.

තිරප්පන්කඩවල රාජමහා විහාරය මෙහි පිහිටි පුරාවිද්‍යාත්මක වැදගත් ස්ථානයයි. මෙහි ටැම්පිට විහාරයක ඉදි කර තිබුණු අතර වර්තමානයේ එහි නටඹුන් පමණක් ශේෂව ඇත. විහාරයෙහි වර්තමාන දියුණුවෙහි පුරෝගාමියා වනුයේ මාහුංගොඩ නන්දසාර හිමියන්ය. අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයෙහි තැන්පත් කර ඇති තිරප්පන්කඩවල වැව් ඉස්මත්තෙන් හමු වූ ශෛලමය බුද්ධ ප්‍රතිමා වහන්සේ පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත පිළිමයකි. එය දුටුගැමුණු රාජ්‍ය යුගයේ නිමවූවක් බව පිළිගැනීමයි. තිරප්පන්කඩවල වැව් ඉස්මත්තේ කෙළවර පිහිටි උස්ගල නම් ගලෙහි පිටුපස වෙහෙර බැඳිගල නැමැති චෛත්‍යයක නටඹුන් දක්නට ලැබේ. යං ඔය ගලා බසින තිරප්පන්කඩවල ගමෙහි ගල් පාලම් දෙකක් දක්නට ලැබේ. ගල්මල් ආසන ද ගල් පිළිම වහන්සේ නමක් ද මෙහි වැඩ සිටිති. පුරාවිද්‍යාත්මක කැණීම්වලින් හමුවූ පුරාවස්තු විහරස්ථානයේ තැන්පත් කර ඇත. ප්‍රවීන චිත්‍ර හා මූර්ති ශිල්පී ඩබ්. ඇම්. ආරියරත්න විසින් කළබිතු සිතුවම්වලින් යුක්ත වීම නිසා සිතුවම් නව්‍යතාවයකින් යුක්ත ස්ථානයක් ද වේ.

බෞද්ධ උරුමය රැක දෙන පූජාවලින් හා අභිචාර විධිවලින් යුක්ත තිරප්පන්කඩවල ග්‍රාමයෙහි මහාපාත්‍ර පූජාව, හතර දෙනා වහන්සේගේ පාත්‍ර පූජා කිරීම, ව්‍යඤ්ජන තිස්දෙකේ පූජාව, අග්ගස්ස (බණ්ඩිකිරි ආහාර පූජාව) පූජාව,

අලුත් බත් දානය, කිරි ආහාර පූජාව වැනි ආගමික පුද පූජා සිදු කරනු ලැබේ.හාල් සේරු තිස් දෙකක කිරි ආහාර තැන්පත් කිරීමෙහි හැකියාව ඇති මහා පාත්‍රයක් භාවිත කර සිදු කරන ආහාර පූජාව මහාපාත්‍ර පූජාවයි. කිසිවිටක පාත්‍රය විහාර මන්දිරයෙන් පිටතට නොගැනීමත් ධෝවනය සඳහා දොරටුව තෙක් රැගෙන යාමත් මෙහි ඇති විශේෂත්වයයි. මෙම පාත්‍රය මැටියෙන් නිමවා තිබීම තවත් වැදගත් කරුණකි. මේ පූජාව හා බැඳුණු ජනප්‍රවාද රාශියක් වේ.විවිධ අසාධ්‍ය රෝගාබාධයන්ගෙන් ආරාක්ෂා වීමට භාර වෙන ගැමියෝ නිරෝගී බව ලැබීමේ ප්‍රීතියෙන් යුක්තව මෙම පාත්‍රයෙන් කිරි ආහාර පූජාව සිදු කරති. මෙම පූජාවේදී ගමරාළට හා භික්ෂූන් වහන්සේට වැදගත් කාර්යයන් සමුදායක් පැවැරී ඇත. හතර දෙනා වහන්සේගේ පූජාව විෂ්ණු, කතරගම, පත්තිනි හා නාථ (ධෘතරාෂ්ට්‍ර, වෛශ්‍රවණ, විරූඪ හා විරූපාක්ෂ යන දෙවියන් පිදීම බෞද්ධ ආභාශය ලැබීමෙන් පසුව) යන සිව්වරම් දෙවිවරුන් වෙනුවෙන් සිදු කරන පූජාවකි. ඇප පඬුරක් වෙන් කර ලෞකික බලාපොරොත්තු සඵල කර ගන්නා ජනයා කෙම්මුර දිනයක ගමරාළගේ සහයෝගයෙන් චාරිත්‍රානුකූලව පූජා කර්මය සිදු කරනු ලැබේ. ඒ සඳහා කිරිබත්, කැවුම්, කෙසෙල් තැන්පත් කර සුවඳ දුම් අල්වා පහන් දල්වා මල් පුදා භික්ෂූන් වහන්සේගේ මූලිකත්වයෙන් දෙවියන්ට පූජා කර දේවාශිර්වාදය ලබා ගනියි. තවද වෙසක් පුන් පොහෝ දිනයේදී ව්‍යඤ්ජන තිස්දෙකේ පූජාවත් පැන්නුමුසු දානයත් චාරිත්‍රානුකූලව සිදු කරනු ලැබේ. අග්ගස්ස පූජාව කෘෂිකාර්මාන්තයට ආවේණික පූජා චාරිත්‍රයකි. ගොයම් කරල් මිරිකා කිරි දමා පිසගන්නාවූ කිරි ආහාරය පූජා කිරීම තුළින් සාම්ප්‍රදායික පූජා චාරිත්‍රය මෙහිදී ආරක්ෂා වී ඇත. මෙම ප්‍රදේශයේ කුඹුරුවල බණ්ඩි ගොයම පීදී එන දුරුතු මාසයේ පසොළොස්වක දින අග්ගස්ස පූජාව සිදු කරන අතර එය ඉමහත් ගෞරවයෙන් සිදු කිරීමත් විවිධ පූජා චාරිත්‍ර අනුගමනය කිරීමත් නිසා ජනයට සැපවත් දිවියක් ගෙවීමට මෙම පූජාව හේතු වේ. කිරි ආහාර සකස් කර බුදුන් වහන්සේට පිදීම තවත් පූජාවකි. ගැමියෝ තම නිවසේ එක් කෙළවරක ගොම පිරියම් කර සකස් කළ ලිපෙහි ඉතාමත් පිරිසිදුව චාරිත්‍රානුකූලව සකස් කළ කිරි ආහාරයෙන් බුද්ධ පූජාව තබා තමන් කිරි ආහාර ගෙනා තල් කොළ පෙට්ටියේ ඉතිරි කිරි ආහාර භික්ෂූන් වහන්සේට පුදනු ලැබේ.

තිරප්පන්කඩවල ග්‍රාමයෙහි ව්‍යාප්තව පවතින අභිචාර විධි අතර මුට්ටි නැමීම, කිරි ඉතිර වීමේ මංගල්‍යයන් පවත්වනු ලැබේ. අයියානායක දෙවියන්ට අත්තක් කඩා භාර වීමත් පුල්ලෙයාර් දෙවියන්ට පොල් ගෙඩියක් උඩක තැබීමත් සිදු කරනු ලැබේ. සිය අස්වැන්නේ මුල් කොටස දෙවියන්ට කැප කර සෙසු කොටස පරිභෝජනය කිරීම සාමාන්‍ය චාරිත්‍රයයි.

දේව ඇදහිලි හා බැඳුණු පූජා චාරිත්‍ර ජනයාගේ උරුමයත් බෞද්ධාභාසයත් සුරක්ෂිත කරමින් පවත්වනු ලැබේ. කිරි ඉතිරවීම ගොවිතැනේදී සශ්‍රීකත්වය අපේක්ෂාවෙන් සිදු කෙරේ. එයින් කාර්ය සාඵල්‍යතාව, පරිපූර්ණත්වයට පැමිණීම, ශෂ්‍ය ඵල නෙළාගැනීමෙන් ජනිත ප්‍රීතිය දෙවියන්ට හා ස්වභාව ධර්මයට පළ කිරීම වැනි විශේෂ අරමුණු අපේක්ෂා කරන බව තිරප්පන්කඩවල ගැමියන්ගේ විශ්වාසයයි. අයියනායක දෙවියන් වැව්වලට අධිපති දෙවියන් ලෙස සලකනු අතර ඒවා ඔහුගේ ආරක්ෂාව යටතේ පවතින බව ගැමියෝ විශ්වාස කරති. දෙවියන් සඳහා භාරවීම පනම් බැඳීම වශයෙන් සළකනු ලැබේ. මෙම ග්‍රාමයේ මාස් කන්නයේ ගොවිතැන ආරම්භ කරන්නේ බිනර දෙපෝයෙන් පසුවය. වැසි ආරම්භයට පෙර කුඹුරු සකස් කළ යුතු හෙයින් පනම් බැඳීම බිනර පෝය අවසන් වීමත් සමග යෙදෙන කෙම්මුර දිනයක සිදු කෙරේ. එදින ගමේ වැඩිහිටියන් කිහිපදෙනෙකු පළමුව විහරස්ථානයට ගොස් බුදුන් වැඳ දේවායට පිවිස තොරණ අබියස පහන් දල්වා බුලත් යහන් ආදිය පුදා අඳුර වැටෙන වේලාවේදී බුලත් පුවක් රැගෙන වැවට යති. වැවේ මධ්‍යයට සමගාමීව වැව් බැම්මේ ස්ථානයක අඩි තුනක් හතරක් පමණ උස දෙබලක් සහිත කෝටුවක් ගෙන එක් තැනෙක සිටුවයි. සුදු පිරුවටවලින් සැරසුණු ගමරාළ කණුව මුල අතුරණ රෙද්දක් මත බුලත් යහන් දෙකක් සාදයි. එකක් අයියනායක දෙවියන්ට ද අනෙක පුල්ලෙයාර් දෙවියන් වෙනුවෙන් ද සාදයි. එක් යහනකට බුලත් හතක් පුවක් හතක් ගනියි. යහන මත කාසිය තබා ගමරාළ කරන යාතිකාවද උඩැක්කි වැයීම ද සිදු කර පනම් කුමරු දෙවියා සඳහා කෝල් මුර කවි ගායනා කර පූජාව අවසානේ පනම් බඳිනු ලැබේ. එම පනම බොල්පනා ඉත්තකුත් සමග කණුවේ බඳියි. ඉදිරි කන්නයේ වසංගත දුරු වී ගමට, ගැමියන්ට, හරකාබානට ආරක්ෂාව අපේක්ෂා කෙරේ. පනම ගැට ගැසීමත් සමග වෙඩිල්ලක් පත්තු කිරීම ශබ්ද පූජාව වශයෙන් සළකයි. කන්නයේ වැව පිරුණු පසු ගමරාළ යාතිකා කර පනම මුදා නැවැත ප්‍රයෝජනය සඳහා ආරක්ෂිතව තබනු ලැබේ. කෘෂිකර්මාන්තය සඳහා මුට්ටි නැමීමේ මංගල්‍යයත් කතරගම දෙවියන් උදෙසා දෙනු ලබන දානයත් තිරප්පන්කඩවල පවත්නා පූජා චාරිත්‍රයකි. ආදී වාසියකුගේ මූලිකත්වයෙන් සිදු කරන විවිධ සාම්ප්‍රදායික පූජාචාරිත්‍ර ක්‍රම ද අනුගමනය කරනු ලැබේ. වර්ෂයෙන් වර්ෂය ගොවිතැන් සරුසාර කිරීමේ අරමුණින් වන්නියේ බණ්ඩාර හා ගම්භාර දෙවියන් උදෙසා ගමේ දානය සිදු කරනු ලැබේ. පුල්ලෙයාර් වැඳීම හා කිරි අම්මාවරුන්ගේ දානය ද දෙහි කැපීම්, කළු දේවතා භාරය, පිරිමහලා දෙන දානය, බලි යාග, බොල් පනා මඩය, පට්ටියේ කිරි ඉතුරුම, වෙලේ වැනි අභිචාර විධි හා පූජා චාරිත්‍ර තිරප්පන්කඩවලට ආවේණික ලක්ෂණයන්ය.

කතරගම දෙවියන්, පුල්ලෙයාර් දෙවියන්, අයියානායක දෙවියන් හා බැඳුණු ජනප්‍රවාද රැසක් මෙ ප්‍රදේශයේ ජනයන් අතර ප්‍රචලිතව ඇත.

බෞද්ධ උරුමයත් තිරප්පන්කඩවල ග්‍රාමයේ ඓතිහාසිකත්වයත් රජමහා විහාරය හා අතීතයේ සිට බැඳී පවතී. අලුවිහාරේ විමලරතන නාහිමිපාණන් වහන්සේගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක රජමහා විහාරස්ථානයේ වර්තමාන දියුණුවක් දක්නට ලැබේ. එම විහරස්ථානයේ පිහිටා ඇති දාගැබ සණ්ඨාකාරය. එය දකුම්කළු ආකාරයෙන් නිමවා ඇත. එබඳු දාගැබක් දක්නට ලැබීම දුර්ලභ ගණයේ අවස්ථාවකි. ඓතිහාසික පාත්‍ර හා නටඹුන් රැසක් ද සහිත විහාරස්ථානය බෞද්ධ උරුමය නොනැසි රැක දෙයි.

## නිගමනය

වැසියන් අතර නොනැසි ආරක්ෂා වන ගැමිකමත් රජමහා විහරස්ථානයේ පුරාවිද්‍යාත්මක උරුමයත් පුද පූජා චාරිත්‍රත් නිසා තිරප්පන්කඩවල ග්‍රාමය හොරොව්පොතාන ප්‍රදේශයේ ප්‍රසිද්ධියට පත් ආදීවාසි ගමකි. මෙහි ව්‍යාප්ත සාම්ප්‍රදායික චාරිත්‍ර විධිවල දක්නට ලැබෙන විශ්වසනීයභාවය හා ගෞරවනීයභාවය සුවිශේෂී බවක් උසුලන අතර ඒ හා බැඳුණු ජනප්‍රවාද ඓතිහාසික වටිනාකමින් යුක්ත වේ.

ප්‍රමුඛ පදඃ තිරප්පන්කඩවල, පරදෙයියාකඩ, බෙත්ම, අභිචාර විධි, වෙහෙර බැඳිගල

## ආශ්‍රිත ග්‍රන්ථ

ගුණවර්ධන, රණවීර. (1993). *සිවුර හා නගුල.* කොළඹඃ සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

පඤ්ඤානන්ද හිමි, හොරොව්පොතානේ. (2000). *කල්පේ කෝරලේ ඇදහිලි හා පුද සිරිත්,* රාගම,කොලිටි ග්‍රැෆික්.

ප්‍රඥාකීර්ති හිමි, කොටහේනේ. (2000). *ආගම හා සමාජය.* කැළණිය, විද්‍යාලංකාර මුද්‍රණාලය.

රාහුල හිමි, කොටපිටියේ. (1996). *බුදු සමය හා පූජා චරිත්‍ර.* කොළඹ, රජයේ මුද්‍රණාලය.

රාහුල හිමි, වල්පොල. (1962). *ලංකාවේ බුදු සමයෙහි ඉතිහාසය.* කොළඹ, එම්. ගුණසේන සහ සමාගම.